Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**ජාතික උරුම ප්‍රාසංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

ටවර් හෝල් රඟහල පදනම

**ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාවට 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2021**

ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2021/2022 අධ්‍යයන වර්ෂයට ටවර් නාට්‍ය හා රංගකලා පාසලට සිසුන් ඇතුළත් කිරීමේ තරග විභාගය - 2021 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල මාධ්‍යයෙන් 2021 ජූලි මස තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

2.0 *නාට්‍ය හා රංග කලාව (දෙවර්ෂ පූර්ණ කාලීන) උසස් ඩිප්ලෝමාව :*

2.1 1978 අංක 1 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත, යුනෙස්කෝවට අනුබද්ධ ජාත්‍යන්තර රංගකලා ආයතනයේ (ITI) නිත්‍ය නියෝජිත ටවර් හෝල් රඟහල පදනම යටතේ පාලනය වන ටවර් නාට්‍ය හා රංග කලා පාසල විසින් නාට්‍ය හා රංගකලාව පූර්ණකාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. පාඨමාලා කාලය වසර 02කි. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 03 වන හා 04 වන මට්ටම ආවරණය කරනු ලබන අතර එසේ (SLQF) 04 මට්ටම අදාළ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමාව ලබා දේ.

2.2 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකින් ඇති කර ගත් එකඟතාව මත මෙම පාඨමාලාව ක්‍රියාත්මක වන අතර නාට්‍ය හා රංගකලාව (දෙවර්ෂ පූර්ණ කාලීන) උසස් ඩිප්ලෝමාව ලබා ගන්නා සිසුන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යායනාංශය මෙහෙයවන අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි පාඨමාලාවේ අවසන් වර්ෂ 02 (SLQF) - 5 හා (SLQF) - 6 සඳහා යොමු කෙරේ. මෙම උපාධි වැඩසටහන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

2.3 මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත අතර මෙම බඳවා ගැනීමේ තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා පදනම මත ටවර් නාට්‍ය හා රංගකලා පාසලට තෝරා ගනු ලැබේ.

2.4 මෙම ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය නාට්‍ය හා රංගකලා විෂයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි.

2.5 මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.

2.6 මෙම පාඨමාලාව සඳහා අනේවාසික පදනම යටතේ සිසුන් ඇතුළත් කරනු ලැබේ.

03. *පාඨමාලාවට ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් සමත් වී තිබිය යුතු අතර ඕනෑම වාර ගණනකදී සිංහල/ ගණිතය/සෞන්දර්යය යන විෂයන් තුන(03) සහ තවත් එක් විෂයකට අනිවාර්යයෙන් සම්මාන හෝ ඊට ඉහළ සාමර්ථ්‍යයක් තිබිය යුතුය. එමෙන්ම දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂය සමත්ව තිබිය යුතුය.

සහ

අ. පො. ස (උ. පෙළ) විභාගයේදී දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුන එකවර සමත්ව තිබීම.

(ආ) මෙම පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමේදී නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස අ. පො. ස (උ. පෙළ) සඳහා හදාරා ඇති සිසුන්ට ප්‍රමුඛතාව ලබා දීම සඳහා සලකා බැලේ.

3.2 2021.04.27 වන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 17ට නොඅඩු සහ අවුරුදු 23ට නොවැඩි විය යුතු අතර අවිවාහක විය යුතුය.

3.3 මෙම පාඨමාලාව නාට්‍ය හා රංගකලා කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පාඨමාලාවක් බැවින් මේ සඳහා ඔබ තෝරා ගතහොත් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

3.4 පූජ්‍ය පක්ෂය හා රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලබයි.

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :*

4.1 පාඨමාලාව සඳහා අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. www.towerhall.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත කර ගත හැකිය.

4.2 විභාග ගාස්තුව රුපියල් 1, 500/- කි. අයදුම්කරු විසින් ලංකා බැංකුවේ හයිඩ් පාර්ක් ශාඛාවේ 2327541 ගිණුම් අංකය වෙත ටවර් හෝල් රඟහල පදනම නමින් ඉහත මුදල බැර කළ යුතුය. මුදල් බැර කර තැන්පත්කරු ලෙස අයදුම්කරු ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස අලවා එවීමට කටයුතු කළ යුතු වේ.විභාග ගාස්තු සඳහා වූ මුදල් ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

4.3 සියලු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2021-04.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්,ටවර් හෝල් රඟහල පදනම,123,විජේරාම මාවත,කොළඹ 07 ලිපිනයට එවිය යුතුය.ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී ප්‍රමාද වන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳ ටවර් හෝල් රඟහල පදනම විසින් වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "2021-2022 ටවර් නාට්‍ය පාසලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05 *විභාග මධ්‍යස්ථාන හා විභාගය පැවැත්වෙන මාධ්‍යය :*
මෙම විභාගය පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1 | අනුරාධපුරය |
| 2 | බදුල්ල |
| 4 | කොළඹ |
| 7 | මහනුවර |
| 9 | මාතර |
| 12 | රත්නපුර |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම්කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ

විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

06 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

1. ජාතික හැඳුනුම්පත
11. වලංගු විදේශ ගමන් බලපත්‍රය
111. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

07 විභාග ක්‍රමය :

7.1 තරග විභාගය සඳහා වූ විෂයන් හා කාලසටහන පහත සඳහන් වේ :-

| විෂයය | කාලය | ලකුණු |
|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය (01) සිංහල භාෂාව සහ අවබෝධය | පැය 02යි | 100 |
| දෙවන ප්‍රශ්න පත්‍රය (02) සාමාන්‍ය දැනීම | පැය 01යි | 100 |

ඉහත විෂයන් සඳහා විෂය නිර්දේශය පහත පරිදි වේ. එක් එක් විෂය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 25% ක් වේ.

01 සිංහල භාෂාව සහ අවබෝධය :
අ.පො.ස (සා. පෙළ) සිංහල විෂය නිර්දේශ මට්ටම හා සිංහල භාෂාව පිළිබඳ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න මෙන්ම අවබෝධය හා අක්ෂර වින්‍යාසය,ව්‍යාකරණ මෙන්ම රචනාමය ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02 සාමාන්‍ය දැනීම :

නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න හා පොදුවේ ලෝකයේ හා ශ්‍රී ලංකාව පිළිබඳ සමාජ, ආර්ථික, දේශපාලනික සංස්කෘතිමය,විද්‍යා, ක්‍රීඩා හා ඉතිහාසය පිළිබඳ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්තය.

7.2 පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් අංකය සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා සතුව තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේදී ලියාපදිංචි කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

7.3 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

7.4 අයදුම්පතේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදා අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

7.5 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

7.6 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයන් හට සිදු වේ.

7.7 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් වැඩිම ලකුණු ලබා ගත් සිසුන් 100 දෙනෙකුගේ නම් ටවර් හෝල් රඟහල පදනම වෙත දන්වා එවීමෙන් පසු අදාළ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඔවුන් කැඳවනු ලැබේ. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යයි තීරණය

වන අයදුම්කරුවකුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.8 ලිඛිත විභාගයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

08 *බඳවා ගැනීමේ ක්‍රමවේදය* :

8.1 ලිඛිත විභාගයේ සිංහල භාෂාව හා සාමාන්‍ය දැනීම යන විෂයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් 100 දෙනකු තෝරා ගෙන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී රංගනය, නර්තනය හා සංගීතය පිළිබඳ අපේක්ෂකයන්ගේ කුසලතාව ටවර් හෝල් රඟහල පදනම විසින් පත් කරනු ලබන විෂය ප්‍රාමාණික පරීක්ෂක මණ්ඩලයක් විසින් ඇගයීමට ලක් කෙරෙයි. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා වන වැඩි විස්තර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයවලුන් වෙත ලිඛිතව ටවර් හෝල් රඟහල පදනම විසින් දැනුම් දෙනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ඔවුන්ගේ අධ්‍යාපන හා අනිකුත් කුසලතා සඳහා ලබා ඇති සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කිරීමද කරනු ලබයි.

8.2 ප්‍රායෝගික පරීක්ෂණයේදී අ. පො. ස (උ .පෙළ) සඳහා නාට්‍ය හා රංග කලා විෂය හදාරා ඇති සිසුන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

8.3 ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගන්නා සිසුන් 50 දෙනකු පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

8.4 පාඨමාලා ගාස්තු :

| | | |
|---|---|---|
| 1 | පාඨමාලාව සඳහා ලියාපදිංචියේදී | රු. 50000.00 |
| 2 | ඉතිරි මුදල සමාන වාරික 04කින් (13625 x 4 ) මෙම මුදල සෑම අධ්‍යයන වාරයකම විභාගයට අයදුම් කිරීමට ප්‍රථම ගෙවිය යුතුය. | රු. 54500.00 |
| 3 | සම්පූර්ණ පාඨමාලා ගාස්තුව | රු. 104500.00 |

09 *ශිෂ්‍යත්ව* :

ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන(දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන වාර දෙකට අදාළ සියලුම විෂයන්ගෙන් වැඩිම ලකුණු ලබා ගන්නා සිසුන් 04 දෙනා වෙනුවෙන් පහත ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ.

සී. දොන් බස්තියන් ජයවීර ශිෂ්‍යත්වය, නීතිඥ චාල්ස් ඩයස් ශිෂ්‍යත්වය, නීතිඥ ජෝන් ද සිල්වා ශිෂ්‍යත්වය, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශිෂ්‍යත්වය ඒ අතර වේ. මෙකී ශිෂ්‍යත්වලාභීන්ට මාසිකව රුපියල් 3,000/- ක මුදලක් වර්ෂයක් පුරා පිරිනමනු ලැබේ.

එමෙන්ම මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා නමින් මාසිකව රුපියල් 750 ක් වූ ශිෂ්‍යත්වයක් වර්ෂයක් පුරා ප්‍රථම අධ්‍යයන වර්ෂයේ ප්‍රථම අධ්‍යයන වාරයේ වැඩිම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව වෙනුවෙන් පිරිනමනු ලැබේ.

දිනය : 2021 මාර්තු 10 වැනි දින.

අධ්‍යක්ෂ ජනරාල්.

විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහායි

**ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ නාට්‍ය හා රංග කලාව පූර්ණ කාලීන (දෙවර්ෂ) උසස් ඩිප්ලෝමා පාඨමාලාවට 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2021**

Competitive Examination to Enroll Students for Full Time (Two Years) Higher Diploma Course of the Tower Drama and Theatre School for the Academic Year 2021/2022-2021

අයදුම්පත

**සැලකිය යුතුයි .-** මෙම අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාග දැන්වීම සහිත ගැසට් නිවේදනය හොඳින් කියවා අදාළ උපදෙස් පිළිපදින්න. නිසි ආකාරයෙන් සම්පූර්ණ කර නැති හෝ අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.

| විභාගයට පෙනී සිටින නගරය | එහි අංකය |
|---|---|
| 1 වන තේරීම | |
| 2 වන තේරීම | |

විභාගය පවත්වන්නේ සිංහල (2) මාධ්‍යයෙන් පමණි.

2. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANA)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

3. අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම

ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා - (GUNAWARDANA H. M. S. K.)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |

4. සම්පූර්ණ නම (සිංහලෙන්) :

| |
|---|
| |
| |

5. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :

| |
|---|
| |
| |

6. ප්‍රවේශ පත්‍රය එවිය යුතු (ලිපිනය) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

7. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ 0 ස්ත්‍රී 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

9. දුරකථන අංකය : ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

නිවස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

10. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

11. 2021.04.27 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

12. විද්‍යුත් ලිපිනය :

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

13. අධ්‍යාපන සුදුසුකම් (ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.) :

13.1 ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයන් හය (06) හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයන් | විෂය අංකය | ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. සෞන්දර්යය | | |
| | | 4. ඉංග්‍රීසි | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

13.2 අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සමත් විෂයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයන් | විෂය අංකය | ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |

13.3 ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

14. දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය (සිංහලෙන්) :

| |
|---|
| |

15. මුදල් කුවිතාන්සි විස්තරය;

15.1 මුදල් කුවිතාන්සි නිකුත් කළ දිනය

15.2 මුදල් කුවිතාන්සි නිකුත් කළ ශාඛාව

15.3

මුදල් කුවිතාන්සිය ගලවා ගත හැකි පරිදි එක් දාරයක පමණක් මැලියම් ගා මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් අනිවාර්යයෙන් ඔබ ළඟ තබාගන්න.

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ.පො.ස.(සා.පෙ.) සමත් බවත් සිංහල, ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන් හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ ඇති බවත් හා උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් හදාරා *ගැසට්* නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා ටවර් නාට්‍ය හා රංගකලා පාසලට තෝරා ගැනීමට නුසුදුස්සකු වන බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

17. අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම :
(දෙපාර්තමේන්තුවක හෝ රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදා අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු විසින් මෙම අයදුම්පත සහතික කළ යුතුය.)

ඉහතින් අත්සන් කර ඇති ............................... මයා/මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි. තවද *ගැසට්* නිවේදනයේ සඳහන් අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) සුදුසුකම් සපුරා ඇති බවත් *ගැසට්* නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි. තවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම අයදුම්පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන,
සුදුසුකම් සහතික කරන අයගේ නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.